දුරකථන/ தொலைபேசி/ Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister — 0112784832, Fax - 0112784825

ලේකම් / செயலாளர் / Secretary — 0112784811, Fax - 0112785162

කාර්යාලය / அலுவலகம் / Office — 0112785141-50, Fax - 0112785491

ඉ-තැපැල්/மின்னஞ்சல்/E-mail- info@moe.gov.lk

වෙබ් ලිපිනය/இணையதள முகவரி/Web address- www.moe.gov.lk

ඔබේ අංකය / உமது இல. / Your No ..........

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ,
බත්තරමුල්ල.
'இசுருபாய',ஸ்ரீ ஜயவர்த்தனபுர கோட்டை, பத்தரமுல்லை.
'Isurupaya', Sri Jayawardanapura Kotte,
Baththaramulla.

මගේ අංකය / எனது இல. / My No — ED/08/26/23/02/04

දිනය / திகதி / Date — 2017.01.25

**චක්‍රලේඛ අංකය : 09/2017**

සියළුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියළුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකවරු,
සියළුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරු,

**රාජ්‍ය විශ්ව විද්‍යාල ප්‍රවේශ සඳහා මාර්ග ගත ලෙස (On Line) අයදුම්පත් යොමු කිරීම - 2016/2017 අධ්‍යයන වර්ෂය**

2016/2017 අධ්‍යයන වර්ෂයේ සිට විශ්ව විද්‍යාල සඳහා මාර්ග ගත ලෙස පමණක් අයදුම්පත් භාර ගැනීමට විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තීරණය කර ඇත. ඒ අනුව රාජ්‍ය විශ්ව විද්‍යාල සඳහා අයදුම් කිරීමේ දී සැලකිය යුතු කරුණු, මාර්ග ගත අයදුම්පත පිරවීම සඳහා උපදෙස් පිළිබඳව පළාත් සහ කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සම්බන්ධීකරන නිලධාරීන් සහ කලාප මට්ටමින් තෝරාගත් ගුරු උපදේශකවරු, ගුරුභවතුන් සහ පළාත් සහ කලාප තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සම්බන්ධීකරන නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩ සටහනක් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පවත්වා ඇත.

මෙම කණ්ඩායම යොදවා ඔබගේ කලාපයේ/පළාතේ උසස් පෙළ පන්ති සහිත පාසැල්වල විදුහල්පතිවරුන් සහ ගුරුවරුන් දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

තවද ඔබ පළාත් විසින් මෙයට පෙර නම් කරනු ලැබූ පළාත්/කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථාන මගින් මෙම මාර්ග ගත විශ්ව විද්‍යාල ප්‍රවේශ අයදුම්පත් ඉදිරිපත් කිරීමට නොමිලේ පහසු කම් සලසා ඇත. මේ සඳහා මධ්‍යස්ථාන වෙත විශ්ව විද්‍යාල කොමිෂන් සභාව විසින් දීමනාවක් ගෙවනු ලැබේ.

එබැවින් විශ්ව විද්‍යාල ප්‍රවේශ අත්පොතෙහි සඳහන් කලාප/පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථාන වෙතින් විශ්ව විද්‍යාල ප්‍රවේශ අයදුම්පත් මාර්ග ගත ලෙස යොමු කිරීමට අවශ්‍ය පහසුකම් සලසා දෙන මෙන් කාරුණිකව දන්වමි.

සුනිල් හෙට්ටිආරච්චි
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත :-

1.සභාපති - විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
2.පළාත් අධ්‍යාපන ලේකම් කරු.දැ.ගැ.පි